

සටනක වතගොත

# රන්ගහවත්ත සටන

අතීතයේ කඩු, දුනු සහ ඊතලවලින් සටන් වැදුණු අපගේ මුතුන් මිත්තන් පෘතුගීසීන්ගේ ආගමනයත් සමඟ ගිනි අවි භාවිතයෙන් යුද්ධ කිරීමට හුරුවුණි. මෙම පරිවර්තනය ක්‍රි.ව 1520-1580 යන කාලපරිච්ඡේදය තුළ ඉතාමත් සීඝ්‍රයෙන් සිදුවිය. මෙම වකවානුව තුළ පෘතුගීසීන් සතුව තිබූ ගිනි අවි සමඟ ඔවුන්ට එරෙහිව කඩු, දුනු සහ ඊතලවලින් සටන් වැදීම අපහසු කරුණක් බව දේශීය නායකයන් වටහා ගැනීම මෙම පරිවර්තනයට ප්‍රධාන හේතුවකි. එවකට සීතාවක රාජධානියේ පාලනය කළ මායාදුන්නේ රජු ඉතා දක්ෂ, එඩිතර රණ ශූරයකු වූ අතර, කිහිප විටකම පෘතුගීසි බලකොටුවලට පහර එල්ල කළත් සිංහල හමුදාව සතුව තිබූ පැරණි අවි ආයුධ නිසා ඔවුන්ට සාර්ථක වීමට නොහැකි විය. මේ හේතුවෙන් තම හමුදාව බලවත් හා කාර්යක්ෂම කිරීම සඳහා සීතාවක හමුදාව නවීන ආයුධවලින් සන්නද්ධ කිරීම කෙරෙහි රජුට දැඩි අවශ්‍යතාවක් ඇති වූ හෙයින් ඒ පිළිබඳව දැඩි අවධානයකින් යුතුව කටයුතු කළේය. ගිනි අවි භාවිතා කරමින් සීතාවක හමුදාව ලබා ඇති සාර්ථකත්වය සමඟ පෘතුගීසීන්ගේ ප්‍රබල අවියක් වූ කාලතුවක්කුවලට එරෙහිව සටන් කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම දිගදුර ප්‍රහාර එල්ල කළ හැකි ගිනි අවි නිෂ්පාදනය කිරීමට මෙන්ම විවිධ රණ උපක්‍රම යොදා ගනිමින් සතුරා මංමුලාකර ඔවුන්ට ප්‍රහාර එල්ල කිරීමට සිංහල හමුදාව සමත්විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සීතාවක හමුදාව බැරලයක ඉදිරිපස ලී කණු දෙකක් මත සවිකළ කාලතුවක්කුවක් හා සමාන අවියක් නිර්මාණය කරන ලදී. එය "කොඩිතුවක්කු" ලෙස නම් කරන ලදී. සටන් වලදී "කොඩිතුවක්කු" අවිය සහ තවත් විවිධ අවි භාවිත කොට සටන්කර සීතාවක හමුදාව පෘතුගීසීන් සතුව තිබූ කාලතුවක්කු කිහිපයක් තම භාරයට ගැනීමට සමත්වුණි. ඉන් පසුව සීතාවක රාජධානිය සඳහා ඉන්දියානු ඉංජිනේරුවන්ගේ සහය ඇතිව ඊට සමාන කාලතුවක්කු තැනීමට රජුට හැකිවිය. ඉන්පසු මෙම කාලතුවක්කු දේශීය ශ්‍රමිකයින් යොදවා "ධච්චිගොඩල්ල, යබරලුව සහ කම්මල්ගොඩල්ල" යන ප්‍රදේශවල නිෂ්පාදනය කරන ලදී.

මායාදුන්න රජුගේ පුතු වූ ටිකිරි බංඩාර නොහොත් සීතාවක රාජසිංහ ද ඔහුගේ පියා මෙන්ම අති දක්ෂ රණ ශූරයකි. මේ නිසා වැඩිදියුණු කරන ලද අවි ආයුධ සමඟින් ටිකිරි බංඩාර කුමරු සීතාවකට පහරදීමට පැමිණෙන පෘතුගීසි හමුදා විනාශ

කිරීමට මායාදුන්නේ රජු විසින් තීරණය කරන ලදී. ඒ අනුව මනා සැලසුමකින් අනතුරුව සුදුසු අවස්ථාව පැමිණි විගස ටිකිරි බංඩාර කුමරු විසින් මෙහෙයවන ලද හමුදාව මුල්ලේරියාව ප්‍රදේශයේදී පෘතුගීසීන් හට දෙවන ප්‍රහාරය එල්ල කරන ලදී. මෙම සටන අදටත් කතාබහ වන මුල්ලේරියා මහ සටන නම් වේ. එහිදී මුල්ලේරියාවේදී ලද ජයග්‍රහණයත් සමග ටිකිරි බංඩාරගේ කීර්තිනාමය බෙහෙවින් පතළ වූ අතර, ඔහු පසුව පළවන රාජසිංහ ලෙස මායාදුන්නේ රජුගෙන් පසු සීතාවක රාජ්‍යත්වයට පත්විය. මොහුද මායාදුන්නේ මෙන් විටින් විට පෘතුගීසීන් හට පහරදීම් සිදුකිරීමෙන් රාජසිංහ රජු පෘතුගීසී හමුදාවන්ට මහත් හිසරදයක් වුණි. මේ හේතුවෙන් පෘතුගීසීන් සීතාවකට විශාල ප්‍රහාරයක් එල්ල කිරීමට නැවතත් සැලසුම් දියත් කළහ.

සීතාවක රාජධානී සමයේ පෘතුගීසි යුද පහුරු දෙකකට සිංහල හමුදාව විසින් පහරදීමේ සිතුවමක් මෙම ලිපිය ආරම්භයේ ඔබට දැකගත හැක. එහි නිරූපණය වන්නේ පෘතුගීසි හමුදාව සීතාවක රාජධානියට පහරදීමේ අරමුණින් අවි ආයුධ සහ වෙඩි බෙහෙත් සවිකරන ලද ප්‍රහාරක පහුරු දෙකක් කැළණි ගඟ ඔස්සේ සීතාවක රාජධානිය දෙසට යාත්‍රා කිරීමේදී ප්‍රහාරයට ලක්වීමේ සිදුවීමකි. එම යුගයේදී රාජසිංහ රජු නොදැනුවත්ව සීතාවක රාජ්‍යයට ඉහළින් කපුටකුටවත් යා නොහැකි බවට කියමනක් ජනප්‍රවාදයේ ඇත. එමගින් රජු සතුව ඉතා ප්‍රබල බුද්ධි තොරතුරු සේවයක් තිබූ බව මනාව පැහැදිලි වේ. මෙම පෘතුගීසි සැලසුම ආරංචි වූ වහා රාජසිංහ රජු විසින් එවකට තනා තිබූ ලෝකඩ කාලතුවක්කුවක් කැලණි ගඟේ දකුණු ඉවුරෙහි රක්ගහවත්ත යන ප්‍රදේශයේ ස්ථානගත කර පෘතුගීසි ප්‍රහාරක පහුරු වෙත රජු විසින්ම කාලතුවක්කුව කුරුමානම් කර වෙඩි තබා එම ප්‍රහාරක පහුරු පෘතුගීසි හමුදාවේ සොල්දාදුවන් සමග විනාශකර කැලණි ගඟේ ගිල්වා දැමූ අයුරු චිත්‍රයෙන් නිරූපණය කරයි. මෙම ප්‍රහාරය සඳහා රජු විසින් රක්ගහවත්ත ප්‍රදේශය තෝරා ගැනීමට හේතු සාධක වූයේ එම ප්‍රදේශයේ තිබූ භූගෝලීය පිහිටීමත්, (ගඟ හොඳින් නිරීක්ෂණය කළ හැකි උස් තැනිතලා බිමක්) සිංහල හමුදාවට වාසිදායක අයුරින් උපක්‍රමශීලීව සතුරා හට පහර එල්ල කිරීමට තිබූ හැකියාවත් නිසා බව අදටත් එම ප්‍රදේශයේ ගවේෂණය කරන්නකුට දැකගත හැකිය.

මෙම සිතුවම ඉතාමත් ගවේෂණාත්මකව නිර්මාණය කර ඇති අතර, මෙහි දැක්වෙන සියලුම අවි ආයුධ සහ කාලතුවක්කු බැරලය, රජතුමාගේ සහ අනෙකුත් සිංහල සොල්දාදුවන්ගේ ඇඳුම් සියල්ලම 1500-1600 කාල වකවානුවට අයත් අවි ආයුධ හා ඇඳුම් ආයිත්තම්වලට අනුව නිරූපණය කර ඇත. මෙම සිතුවම නිර්මාණය කිරීම සඳහා මූලික වශයෙන් දැනට කොළඹ කෞතුකාගාරයේ සංරක්ෂණය සඳහා තබා ඇති "අලකේශ්වර යුද්ධය (ඒ.පී 4 දරණ පුස්කොළ පොත)" මූලාශ්‍ර කරගෙන ඇති අතර, එහි මෙම සිදුවීම මෙසේ සටහන් කර ඇත.

ඒ සිටි නොබෝ දවසකට පසු කෝට්ටේ සේනාවක් ප්‍රතිකාල් සේනාවන් ගගිනුත් ගොඩිනුත් යුද්ධයට එන කළ රාජසිංහ මහරජාණෝ ලෝකඩ කාලතුවක්කුවක් ගෙන්වා කාලතුවක්කුව සුදානම් කොට වෙඩි බෙහෙත් හා යකඩ උණ්ඩ දමා තානිච්චි කොට උන්වහන්සේම කුරුමානම් බලා පත්තු කළ උණ්ඩ කස්තේලුවව් වැදි පොල් කඳනුත් ගසාගෙන කලාසිකාරයෝ කීපදෙනකුත් ප්‍රතිකානුත් කීපදෙනකුන්ටත් වැදි පඩව්ව බිඳ ගිලිහී දිය දුටුවේය. ඒකල කස්තෙලුව ගඟ පහළට ඇදගෙන ගියහ.

මීට අමතරව මෙම සිදුවීම් සබැඳිව එවකට පෘතුගාලයේ සිටි ලේඛයකු වූ *Diago De Couto* විසින් පෘතුගීසි හමුදාව විසින් පෘතුගාලයට එවන ලද සංදේශ ලිපි සහ ලංකාවේ සිටි පෘතුගාලයට පැමිණි පෘතුගීසි සෙබළුන්ගෙන් ගත් තොරතුරුවලට අනුව ඔහු විසින් එළි දක්වන ලද *"THE HISTORY OF CEYLON THE EARLIST TIMES TO 1600 AD"* යන ජර්නලය මෙම සිදුවීම සබැඳිව පහත පරිදි සටහන් කර ඇති බව නිරූපණය කරයි.

***208 JOURNAL, R.A.S (CEYLON). [Vol.XX***

***pots of powder, fire-bombs, and other contrivances and materials, to go by the river and invest the tranqueira, and he with all the army crossed over from the other side, leaving orders for the foists to tow the castles until they were alongside of the tranqueira. And the signal having been given at the hour of attack, the foists began to row up the river with the castles : and when they were already near the tranqueira, they fired upon them with a camello1, which struck the foist that was in front in the prow, and the ball went tearing its way through the middle of it as far an the poop, killing more than twenty sailors whom it took in line who were hauling at certain roqueiras2, and knocked them all to pieces. Upon this the vessels stopped, and Dom Jorge ordered to signal to them to turn about, which he also did, because he knew that all that were in the castles were certain to have been terrified by that mishap3.***

තවද *"Time Line Of Muskets And Cannons In Sri Lanka"* යන වෙබ් පිටුවේ මෙම රක්ගහවත්ත සටන පිළිබඳව මෙසේ සටහන් වන අතර, මෙය සඳහා මහනුවර යුගයේ ලියැවුණු "රාජාවලිය" නම් ග්‍රන්ථය මූලාශ්‍ර කර ඇති බවද සටහන් වේ.

*The Portuguese Planned to attack Seethamaka Rajasinghe who has camps at Rakgahawatte by advancing on either bank of Kelani river and bringing a cannon mounted on a castle built on two Padda - boats. Seethawaka Rajasinghe was a very cautious and tactical leader who anticipated the threats that he might have to face. Once he was aware of the advance of Portuguese along the river, he was ready for them, he ordered a bronze canon to be mounted on the right bank and charge with a ball, and as the flacting castle came in to view, Seethawaka Rajasinghe himself aimed and fired the gun and with such good fortune that it taked the towing boat and killed 20 sailors.*

පෙර රජ දවසේ පටන් යුද ජයග්‍රහණ සඳහා කාලතුවක්කුව භාවිතා කර ඇති බැව් මෙමගින් මනාව පැහැදිලි වෙන කරුණක් බැව් ඉතා සාඩම්බරයෙන් යුතුව සටහන් කරන්නෙමු.

රෙජිමේන්තු මධ්‍යස්ථානය
කාලතුවක්කු හමුදා රෙජිමේන්තුව